# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1922/4 - 2015 ජූලි මස 07 වැනි අඟහරුවාදා - 2015.07.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

6 වන වගන්තිය යටතේ වන නියෝගය

***සේවා සැපයුම්කරුවන් පත්කිරීම***

රෙජිනෝල්ඩ් කුරේ වන මම, ගුවන් සේවා අමාත්‍යවරයා වශයෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි I - උපලේඛනයෙහි නියමකර ඇති නියමයන්ට සහ කොන්දේසි වලට යටත්ව, සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම (ඉහත සඳහන් පනත යටතේ පත්කරන ලද ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු) මෙහි II - උපලේඛනයෙහි නියමිත පරිදි හම්බන්තොට, මත්තල, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී පහත සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා සේවා සැපයුම්කරුවකු වශයෙන් අද දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් පත්කරමි.

*අ.* භූමි මෙහෙයුම් පහසුකම් සහ සේවා සැපයීම

*ආ.* ගුවන් යානා පිරිසුදු කිරීමේ සේවා ඇතුළුව අංගනයේ තිබෙන ගුවන් යානා පිටත්කර යැවීම සඳහා අවශ්‍ය සහාය හෝ උපකරණ හෝ සැපයීම

රෙජිනෝල්ඩ් කුරේ,
ගුවන් සේවා අමාත්‍ය.

2015 ජූනි මස 25 වැනි දින,
බත්තරමුල්ලේ දීය.

***I - උපලේඛනය***

*පත්කිරීමේ නියමයන් සහ කොන්දේසි*

1. II - උපලේඛනයෙහි නියම කර ඇති පහසුකම් හෝ සේවා සැපයීමේදී සේවා සැපයුම්කරු, අදාළ වන පරිදි, 2010 අංක 14 දරන සිවිල් ගුවන සේවා පනතේ සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි, රීති, හෝ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති කිසිවක හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක හෝ ඇතුළත් වන, අදාළ නෛතික විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු ය ;

2. සේවා සැපයුම් කරු, ඒ ඒ පරිදි අමාත්‍යවරයා විසින් හෝ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් හෝ සේවා සැපයුම් කරුගේ රාජකාරි, කාර්යයන් සහ වගකීම් ඉටුකිරීම සම්බන්ධයෙන් කලින් කල දෙනු ලබන පොදු නියෝග හෝ විශේෂ නියෝග හෝ කිසිවකට අනුකූලව කටයුතු කළ යුතු ය ;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. සේවා සැපයුම්කරු ගුවන් ප්‍රවාහන කර්මාන්තයේ යහපත සහ වර්ධනය උදෙසා ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු විසින් අතුරු බද්දට දී ඇති චංචල සහ නිශ්චල දේපොළ සියල්ල හොඳ තත්ත්වයෙන් නඩත්තු කළ යුතු අතර එවැනි චංචල සහ නිශ්චල දේපොළ කිසිදු තුන්වන පාර්ශවයකට බද්දට නොදිය යුතු ය ;

4. මෙම නියෝගය යටතේ සේවා සැපයුම්කරු විසින් සපයනු ලබන පහසුකම් හෝ සේවා කිසිවක් සම්බන්ධව, මෙම නියෝගයෙහි සඳහන් දිනයෙන් පසු සේවා සැපයුම්කරු විසින් අත්සන් කරනු ලබන සෑම කොන්ත්‍රාත්තුවක්ම සේවා සැපයුම්කරු විසින්ම, ඔහු වෙනුවෙන්ම අත්සන් කරන ලද කොන්ත්‍රාත්තු වශයෙන් සැලකිය යුතු අතර රාජ්‍ය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුම් වශයෙන් නොසැලකිය යුතු ය. එවැනි කොන්ත්‍රාත්තුවක් සම්බන්ධව කිසිදු ආකාරයක වගකීමක් රාජ්‍යය මත පැවරීම සිදු නොකළ යුතු ය ;

5. ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් හෝ සිවිල් ගුවන් සේවා අධිකාරිය හෝ සේවා සැපයුම්කරුට ලිඛිතව නියම කළ අවස්ථාවක, සේවා සැපයුම්කරු මෙම පත්වීම යටතේ සපයනු ලබන කිසියම් පහසුකමකට හෝ සේවාවකට අදාළ පරිපාලනමය මෙහෙයුම් තාක්ෂනික හෝ මූල්‍යමය කරුණු පිළිබඳ සියළුම අදාළ තොරතුරු අවස්ථාවෝචිතව ලේකම්වරයා වෙත හෝ සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත හෝ සැපයීය යුතු ය ;

6. සේවා සැපයුම්කරු, අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට හෝ අවස්ථානුකූලව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් හෝ පළකරනු ලබන අවශ්‍යතා කිසිවකට හෝ අනුකූලව පහසුකම් සහ/හෝ සේවා සැපයීම නොකඩවා පවත්වාගෙන යන බවට සහතික වෙමින් මෙහි II - උපලේඛනයෙහි නියමිත ගගන නාවික සේවා සැපයීම සඳහා අවස්ථාවෝචිත පරිදි සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් හෝ නියම කරනු ලබන අවශ්‍යතා අනුව කටයුතු කරමින් අදාළ වන පරිදි අවශ්‍ය බලපත්‍ර හෝ සහතික හෝ ලබාගත යුතු ය ;

7. සේවා සැපයුමකරු, මෙම පත්කිරීමෙන් බලය පවරන ලද ගගන නාවික සේවා සැපයීම සඳහා උපයෝගී කරගනු ලබන සේවක පිරිස්, උපකරණ, මෙවලම්, පහසුකම් සේවා සහ කාර්ය පටිපාටි සඳහා අවශ්‍ය, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර, ප්‍රමානන, අවසර පත්‍ර අනුමැතීන් හෝ බලය පැවරුම් හෝ අවශ්‍ය අවස්ථාවන්හි ඒ ඒ පරිදි ලබාගෙන ඇති බවට සහතික විය යුතු ය ;

8. අදාළ වන පරිදි අවශ්‍ය බලපත්‍රය හෝ සහතිකය හෝ ලබාගැනීම සහ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත ගෙවිය යුතු ගාස්තු සේවා සැපයුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු ය ;

9. සේවා සැපයුම්කරු අමාත්‍යවරයාගෙන් ලබාගත් ලිඛිත අනුමැතියක් රහිතව II - උපලේඛනයෙහි සඳහන් කිසිදු සේවාවක් සැපයීම වෙනස් කිරීම, අත්හිටුවීම හෝ නැවැත්වීම සිදු නොකළ යුතු ය ;

10. සේවා සැපයුම්කරුගේ මෙහෙයුම් අතරතුර උද්ගත විය හැකි විභව වගකීම් හෝ වන්දිගෙවීම් හෝ ඉටුකිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සතුටුදායක වන ආකාරයේ ප්‍රමාණවත් රක්ෂණ ආවරණයක් සූදානම් කිරීම සේවා සැපයුම්කරුගේ වගකීම වන අතර එවැනි වගකීම් හෝ වන්දිගෙවීම් පිළිබඳව වගකීම රාජ්‍යය මත නොපැවරෙනු ඇත ;

11. ගුවන් සේවා නිරුපද්‍රතතාව, සුරක්ෂිතතාව, ක්‍රමවත් බව, කාර්යක්ෂමතාව හෝ රටේ ගුවන් ප්‍රවාහන මෙහෙයුම් වල අරපිරිමැස්ම වෙනුවෙන් එවැනි පියවරක් තැබීම අවශ්‍ය වේ යයි අදහස් කරන ඕනෑම අවස්ථාවක හෝ සේවා සැපයුම්කරුගෙන් ඒ සඳහා ඉල්ලීමක් ලැබුණු අවස්ථාවක හෝ මෙම නියෝගය මගින් කරන ලද සේවා සැපයුම්කරු පත්කිරීම අවලංගු කිරීමේ අයිතිය අමාත්‍යවරයා තමන් වෙත රඳවා ගනියි ;

12. සංස්ථා අනන්‍යතාව, කොටස් මූලධනය හෝ සේවා සැපයුම්කරුගේ නම වෙනස් කිරීම සඳහා අමාත්‍ය වරයාගේ ලිඛිතව ලබාගත් පූර්ව අනුමැතිය අවශ්‍ය වේ ;

13. අමාත්‍යවරයාගෙන් ලබාගත් ලිඛිත අනුමැතියක් රහිතව, සේවා සැපයුම්කරු II - උපලේඛනයෙහි නියමිත පහසුකම් හෝ සේවා කිසිවක් සැපයීම තවත් අයෙකුට මාරු කිරීම හෝ අතුරු බද්දකට දීම හෝ සිදු නොකළ යුතු ය.

## *II - උපලේඛනය*

*සේවා සැපයුම්කරුට සැපයීමට නියමිතව ඇති පහසුකම් සහ සේවා*

*අ.* **භූමි මෙහෙයුම් පහසුකම් හෝ සේවා සැපයීම**

පහත සඳහන් පහසුකම් හෝ සේවා එකක් හෝ වැඩිගණනක් ඇතුළත් භූමි මෙහෙයුම් පහසුකම් හෝ සේවා සැපයීම ;

**සූචිය පහසුකම්/සේවාවේ විස්තරය**

1. *මනා පරිපාලනය සහ අධීක්ෂණය*

පහත සඳහන් කාර්යයන් ගෙන් කිසියම් එක් කාර්යයක් හෝ වැඩි ගණනක් හෝ ඉටුකිරීම

(අ) මෙහෙයුම්කරු නියෝජනය කිරීම

(ආ) පළාත් පාලන ආයතන සහ වෙනත් සංවිධාන සමග සම්බන්ධීකරණ සේවාව

(ඇ) එහි නියෝජිතයින්ට කාර්යාල ඉඩකඩ සපයාදීම

(ඈ) භාර පාලනය, පණිවුඩ සහ විදුලි සංදේශනය

(ඉ) ඒකක පැටවුම් උපක්‍රමික මෙහෙයුම, ගබඩා කිරීම සහ පරිපාලනය

(ඊ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් අනුමත කරන ආකාරයට මෙහෙයුම්කරුගේ ගුවන්යානා, නැව්බඩු සහ කාර්යාල පරිශ්‍රය ආශ්‍රිත සුරක්ෂිතතා පියසර අධීක්ෂණය කිරීම

(උ) මෙහෙයුම් කරුවකු සඳහා සහ ඔහු වෙනුවෙන් පියසරයකට පෙර, පියසරය අතරතුර හෝ පියසරයට පසුව කෙරෙන වෙනත් කිසියම් අධීක්ෂණ කාර්යයක්

2. *මගී මෙහෙයුම්*

(අ) ලගාවන, පිටත්වන, මාරුවන හෝ සංක්‍රමණික මගීන්ට අවශ්‍ය, ප්‍රවේශ පත්‍ර සහ ගවන් ලියවිලි හරි වැරදි බැලීම, ගමන් මලු ලේඛනගත කිරීම සහ තෝරන ප්‍රදේශයට රැගෙන යාම ඇතුළු ඕනෑම ආකාරයකින් සහායවීම

(ආ) මගීන්ට සහ ගුවන් තොටුපොළ පාවිච්චි කරන්නන්ට විවේකාගාර පහසුකම් සපයාදීම සහ මගී මෙහෙයුමට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන හෝ වෙනත් කාර්යයන් කිසිවක්

3. *ගමන් මලු මෙහෙයුම*

පහත සඳහන් කාර්යයන් ගෙන් එකක් හෝ වැඩිගණනක් හෝ ඉටු කිරීම

(අ) තෝරන ප්‍රදේශය තුළ ගමන් මලු මෙහෙයුම

(ආ) පිටත්වීම සඳහා ගමන් මලු තේරීම

(ඇ) ගමන් මලු ගුවන් යානයේ සිට තෝරන ප්‍රදේශය දක්වාත් තෝරන ප්‍රදේශයේ සිට ගුවන් යානය දක්වාත් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ඇති උපක්‍රමිකයන්ට ගමන්මලු පැටවීම සහ බෑම

(ඈ) ගමන් මලු තෝරන ප්‍රදේශයේ සිට මගීන් විසින් ආපසු ලබාගන්නා ප්‍රදේශය දක්වා ප්‍රවාහනය කිරීම සහ ගමන් මළු මෙහෙයුමට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන වෙනත් කාර්යයන් කිසිවක්.

4. *ගුවන් බඩු සහ තැපැල මෙහෙයුම*

පහත සඳහන් කාර්යන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් හෝ ඉටු කිරීම

*ගුවන් බඩු*

(අ) අපනයන මාරුකිරීම සහ ආනයන ගුවන් බඩු සම්බන්ධ භෞතික මෙහෙයුම

(ආ) ඊට අදාළ ලිපිලේඛන සම්බන්ධව කටයුතු කිරීම

(ඇ) රේගු කාර්ය පටිපාටි

(ඈ) අන්තරායකාරී ද්‍රව්‍ය මෙහෙයුම

(ඉ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අනුමත කරනු ලබන පරිදි සුරක්ෂිතතා කාර්ය පටිපාටි ක්‍රියාත්මක කිරීම හෝ ගුවන් බඩු මෙහෙයුමට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන හෝ වෙනත් කාර්යයන් කිසිවක්

*තැපැල*

(අ) ලැබෙන හෝ යැවෙන තැපැල පිළිබඳ භෞතික මෙහෙයුම

(ආ) ඊට අදාළ ලිපිලේඛන සම්බන්ධව කටයුතු කිරීම

(ඇ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජෙනරාල් විසින් අනුමත කරනු ලබන පරිදි සුරක්ෂිතතා කාර්ය පටිපාටි ක්‍රියාත්මක කිරීම හෝ තැපැල මෙහෙයුමට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන හෝ වෙනත් කාර්යයන් කිසිවක්

*5. රැම්ප් මෙහෙයුම*

පහත සඳහන් සේවා එකක් හෝ වැඩි ගණනක් හෝ ඉටු කිරීම

(අ) ලඟාවීමේදී සහ පිටත්වීමේදී භූමිය මත ඇති ගුවන් යානා හැසිරවීම

(ආ) ගුවන් යානා ගාල් කිරීමට සහායවීම සහ සුදුසු උපක්‍රමික සැපයීම

(ඇ) ගුවන් යානය සහ ගුවන් පෙදෙසේ සේවා සපයන්නා අතර සන්නිවේදනය

(ඈ) ගුවන් යානායට පැටවීම සහ පිටතට බෑම

(ඉ) ගුවන් යානා සේවක පිරිස සහ ඔවුන්ගේ ගමන් මළු ගුවන් යානය සහ පර්යන්තය අතර ප්‍රවාහනය කිරීම

(ඊ) එන්ජින් පන ගැන්වීම සඳහා උචිත ඒකක සැපයීම සහ මෙහෙයුම් කිරීම

(උ) ගුවන් යානා ඇදගෙන යාම සහ ඇදගෙන යාමේ උපක්‍රමික සැපයීම සහ මෙහෙයුම් කිරීම

(ඌ) ආහාර සහ බීම වර්ග ප්‍රවාහනය, ගුවන්යානයට පැටවීම, ගුවන් යානයේ ඉවතට බෑම හෝ රැම්ප් මෙහෙයුමට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන හෝ වෙනත් කාර්යයන් කිසිවක්

**(ආ) ගුවන් යානා පිරිසිදු කිරීමේ සේවා ඇතුළුව, අංගනය මත ඇති ගුවන් යානා පිටත් කර යැවීම සඳහා අවශ්‍ය සහාය හෝ උපකරණ හෝ ලබාදීම**

ගුවන් යානා පිරිසිදු කිරීමේ සේවා ඇතුළුව, අංගනය මත ඇති ගුවන් යානා පිටත් කර යැවීම සඳහා අවශ්‍ය සහාය හෝ උපකරණ හෝ සැපයීමේ කාර්යයට පහත සඳහන් කාර්යයන් එකක් හෝ වැඩි ගණනක් හෝ ඇතුළත් වේ.

(1) ගුවන් යානා සම්බන්ධ සේවා

ගුවන් යානය සහ වැසිකිළිය ඇතුළත සහ පිටත පිරිසිදු කිරීම සහ ජලය සැපයීමේ සේවා සහ ගුවන් යානා සේවාවන්ට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන හෝ වෙනත් කාර්යයන් කිසිවක්

(2) ගුවන් යානා නඩත්තුව

පහත සඳහන් සේවා එකක් හෝ වැඩි ගණනක් හෝ ඉටු කිරීම

(අ) පියසරයකට පෙර සිරිත් ප්‍රකාරව කරනු ලබන සේවා

(ආ) සිරිත් ප්‍රකාර නොවන සේවා

(ඇ) අමතර කොටස් සහ සුදුසු උපකරණ සැපයීම සහ යෙදීම

(ඈ) සුදුසු ගාල් කිරීමේ සහ/හෝ හැඟර (Hanger) ඉඩකඩ වෙන් කිරීම සඳහා ලැබෙන ඉල්ලීම් සහ ගුවන් යානා නඩත්තුවට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන හෝ වෙනත් කාර්යයන් කිසිවක්.

(3) පියසර මෙහෙයුම් සහ සේවක පිරිස් පරිපාලනය

පහත සඳහන් සේවා එකක් හෝ වැඩි ගණනක් හෝ ඉටු කිරීම

(අ) පිටත්වීමේ ගුවන් තොටුපොළේදී හෝ වෙනත් කිසියම් ගුවන් තොටුපොළකදී හෝ පියසරය සූදානම් කිරීම

(ආ) අවශ්‍ය වෙතොත් යළි - පිටත් කිරීම ඇතුළු පියසරය අතරතුර සහාය

(ඇ) පියසරයෙන් පසු කාර්යයන්

(ඈ) සේවක පිරිස් පරිපාලනය හෝ ගුවන් යානා මෙහෙයුම් කරුවන්ගේ පියසර මෙහෙයුම් සහ පිරිස් පරිපාලනයට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන හෝ වෙනත් කාර්යයන් කිසිවක්

(4) මතුපිට ප්‍රවාහනය

ගුවන් පෙදෙස තුළ හෝ ඉන් පිටතට මතුපිට ප්‍රවාහන සේවා සැපයීම අවශ්‍ය වන විට පහත සඳහන් එකක් හෝ ඊට වැඩි ගණනක් සිදු කිරීම

(අ) සේවක පිරිස, ඔවුන්ගේ ගමන්මළු, නැව්බඩු සහ තැපෑල පර්යන්තය සහ ගුවන් යානය අතර ප්‍රවාහනය කිරීම සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

(ආ) අංගනය මතදී අවශ්‍ය වන වෙනත් (සිරිත් ප්‍රකාර නොවන) විශේෂ ප්‍රවාහන කාර්යයන් හෝ ගුවන් යානා පාවිච්චි කරන්නන්ට අදාළ මතුපිට ප්‍රවාහනයට සම්බන්ධ වන හෝ ඊට ආනුශංගික වන හෝ වෙනත් කාර්යයන් කිසිවක්

07 - 1023

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.